**සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල - 2022**

**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත 01 හි 128 ඡේදය ප්‍රකාරව විගණනයට ඉදිරිපත් කර ඇති මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ මුහුණතෙහි එක් එක් අයිතමයට අදාළව සටහන්වල ඇති සම්බන්ධිත තොරතුරු වලට හරස් යොමු දක්වා ක්‍රමවත් ආකාරයට ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරිමේ දී අදාළ අයිතමයන් සම්බන්ධ උපලේඛනවල අංක ඇතුළත් කිරිමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත 1 හි 150 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ, අස්ථිත්වය පිහිටි තැන, නෛතික ස්වභාවය, මෙහෙයුම්වල ස්වභාවය, එහි ප්‍රධාන කටයුතුවල විස්තරයක්, මෙහෙයුම් පාලනය කිරිමට අදාළවන ව්‍යස්වස්ථාව පිළිබඳ යොමුව පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් මඟින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 150 ඡේදය ප්‍රකාරව තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 15 හි 14 ඡේදය ප්‍රකාරව අයවැය ලේඛනගත වටිනාකම් හා තත්‍ය වටිනාකම් සැසඳීමක් කර මූල්‍ය ප්‍රකාශන වල අයවැය ලේඛන තීරුවක් වශයෙන් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී රාජ්‍ය අංශයේ ගිණුම් කරණ ප්‍රමිත 15 හි 14 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අය වැය ලේඛන තීරුවක් ඇතුළත් කිරිමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 57 ඡේදය ප්‍රකාරව, දේපල අයිතමයක මුළු පිරිවැය හා සසදන විට සැලකිය යුතු පිරිවැයකින් සමන්විත එම අයිතමයේ කොටස් සෑම එකක්ම වෙන් වෙන්ව හඳුනාගත යුතු වුවත් මුළු පිරිවැය රු.127,636,460 ක්වූ නිලාවේලී පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහිත අක්කර 7 පර්චස් 37 ක ඉඩම, ඉඩම් හා ගොඩනැඟිලි වශයෙන් වෙන් වෙන්ව හඳුනා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ගොඩනැඟිලි ක්ෂය වටිනාකම ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි. | මේ වන විට නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයේ අඩක් නිම කර ඇති කාමර 05 හි නවීකරණ කටයුතු ආරම්භ කර ඇති බැවින් එම කටයුතු අවසන් වීමෙන් අනතුරුව ගොඩනැඟිල්ල සහ ඉඩම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 57 ඡේදය ප්‍රකාරව වෙන් වෙන් වශයෙන් තක්සේරු කර ඒ අනුව ගොඩනැඟිලි ක්ෂය කිරිම් ගණනය කර ගිණුම්ගත කිරිමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් යටතේ කාර්යාල උපකරණ ලෙස දිස්ත්‍රික්ක 13 කට අදාළව එකතුව රු. 1,248,798 ක හඳුනා නොගත් ශේෂයක් 1998 වර්ෂයේ සිට ඉදිරියට ගෙනා ශේෂයක් වශයෙන් දක්වා තිබුණි. එම වත්කම් හඳුනාගෙන සාධාරණ අගයට ගිණුම්ගත කර නොතිබුණි | සමාජ ආරක්ෂණ අරමුදලට අයත් වත්කම් හඳුනා_ගැනීමට හැකි වන පරිදි වෙන් වෙන්ව ඉන්වෙන්ට්‍රියකට ඇතුළත් කිරිමට දිස්ත්‍රික් මටට්මින් උපදෙස් ලබාදී ඇත. ස්ථාවර වත්කම් යටතේ 1998 වර්ෂයේ සිට හඳුනානොගත් ශේෂයන් නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | වත්කම් හඳුනාගෙන සාධාරණ අගයකට ගිණුම්ගත කිරිමට කටයුතු කල යුතුය. |
| (ආ) | අරමුදලට අදාලව ඇති වත්කම් හඳුනාගත හැකිවන පරිදි සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 46,133,459 ක් වූ අරමුදල සතු වත්කම් (නීලාවේලි හැර) සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | සමාජ ආරක්ෂණ අරමුදලට අයත් වත්කම් වෙන්ව හඳුනාගැනීමට හැකිවන පරිදි වෙන්කර ඉන්වෙන්ට්‍රියකට ඇතුළත් කර පවත්වාගෙන යන ලෙසට හා එම තොරතුරු ප්‍රධාන කාර්යාලයට එවන ලෙසට දිස්ත්‍රික්ක වෙත උපදෙස් ලබා දී ඇති අතර මේ වන විට දිස්ත්‍රික්ක 21කින් පමණ තොරතුරු ලබා දී ඇත. ඒ අනුව ඉදිරියේදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ. | අරමුදලට අදාලව ඇති වත්කම් සමීක්ෂණය කිරිමට කටයුතු කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2021 අප්‍රේල් 6 දින සමෘද්ධි සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් මධ්‍යස්ථානය වෙත ලබා දි තිබූ ජංගම වායුසමීකරණ යන්ත්‍ර 2 හි වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. මෙම උපකරණ 2021 වර්ෂයේ සමීක්ෂණ වාර්තාව මහින්ද තහවුරු කර නොතිබුණි. | මෙම ජංගම වායු සමීකරණ යන්ත්‍ර දෙක නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන ඉන්වෙන්ට්‍රි ලේඛණය ඇතුළත් කර ඇති අතර ඉදිරියේ දී එහි වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශණ වලට ඇතුළත් කිරිමට කටයුතු කරනු ලැබේ. | සියළුම වත්කම් ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. 381 (1) | 2017 වර්ෂයේ සිට බැංකු ජංගම ගිණුමක් පවත්වාගෙන ගොස් තිබුණ ද මෙම වාර්තාවේ දිනය දක්වාම භාණ්ඩාගර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයන් විමසීම් කර, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ජේදය | 2022 වර්ෂය සඳහා අරමුදල විසින් රු.52,278,320 ක් වූ පරිගණක, ගොඩනැගිලි ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා සඳහා ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණද ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරි මිළ දී ගැනීම් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1. ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ඇ) | 2018 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2018/03 ජේදය | අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික නිර්දේශය ලබා නොගෙන අරමුදලේ භාරකාර මණ්ඩල අනුමැතිය මත 2021 නොවැම්බර් 08 සිට 2024 මැයි 07 දක්වා සේවා දිගු ලබාදෙමින් මාසිකව රු. 107,415 වැටුපකට විශ්‍රාමික නිලධාරිනියක ගණකාධිකාරි තනතුර සඳහා පත්කර තිබුණි. | භාරකාර මණ්ඩලයට ඇති බලතල ප්‍රකාරව 2021 දෙසැම්බර් 03 දිනැති භාරකාර මණ්ඩලයේ තීරණ අනුව මෙම පත්කිරිම සිදු කර ඇත. ඒ අනුව එම පත්කිරිමට අදාලව මාසික දීමනාව තීරණය කිරිම සඳහා ර.ප.චක්‍ර.3/2016 හා 3/2018 උපයෝගි කරගෙන ඇත. | අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික නිර්දේශය ලබාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,328,591,826 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,518,333,556 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,846,925,382 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රතිලාභීන්ගේ දායක මුදල් වැඩි කිරීම හා ආයෝජන පොලී ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමෘද්ධි සමාජ සංවර්ධන භාර අරමුදල ඔප්පුවේ 6(4) ඡේදය ප්‍රකාරව අනුග්‍රහකයා විසින් උප ප්‍රතිපුරුෂයෙකු ලෙස එක් භාරකරුවෙකු පත් කිරීමේ බලය ඇති බවත් 6(9) ඡේදය ප්‍රකාරව කිසිදු සමාජිකයකු විසින් සිදු කරන ලද ප්‍රතිඋපකාරයක් වෙනුවෙන් වැටුපක්, දීමනාවක් හෝ ප්‍රසාද දිමනාවක් නොගෙවන බව දක්වා තිබියදී දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අරමුදලේ සභාපති ධූරය දරමින් 2020 පෙබරවාරි සිට 2022 දෙසැම්බර් දක්වා වැඩබැලීමේ වැටුප් වශයෙන් රු.770,000 ක් ලබාගෙන තිබුණි. | 2014 වර්ෂයේ සමෘද්ධි දෙපාර්තමේන්තුව පිහිටුවීමට පෙර අරමුදල වෙනම අරමුදලක් ලෙස ක්‍රියාත්මක වූ අතර සමෘද්ධි කොමසාරිස් ජනරාල් නිල බලයෙන් අරමුදලේ සභාපති ධූරයේ කටයුතු කර ඇත. එම කාලයේදී සේවය කල ජනරාල්වරුන් මෙන්ම දෙපාර්තමේන්තුව යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරුන්ද භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත මෙම දීමනා ලබාගෙන ඇත. | අරමුදලේ භාර ඔප්පුව ප්‍රකාරව ක්‍රියා කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලාවෙලි පුහුණු මධ්‍යස්ථානයෙහි 2021 හා 2022 වර්ෂයන් තුල පිළිවෙලින් පුනරාවර්තන වියදම රු.1,389,766ක් හා රු.1,907,113 වන අතර ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රු.2,258,116 ක් හා රු.2,495,128 වි තිබුණ ද සමාලෝචිත වර්ෂය තුලදී දින 16 ක් තුල සම්පත් දායකයින් ඇතුළුව පුහුණුලාභීන් 216 ක් සහභාගීත්වයෙන් වැඩසටහන් 03ක් පමණක් පවත්වා තිබුණි. මධ්‍යස්ථානය සතුව පිරිවැය රු. මිලියන 128ක වත්කම් තිබුණද එම වත්කම් නිසි පරිදි කළමනාකරණය නොකිරිම, ආදායම් උත්පාදනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කලමනාකාරිත්වය විසින් නොගැනීම හා අධීක්ෂණ කටයුතු සිදු නොවීම හේතුවෙන් සමාජ ආරක්ෂණ අරමුදලෙන් දරනු ලබන වියදම් නිශ්කාර්ය වි ඇති බව නිරික්ෂණය විය. | රට තුළ පැවැති කොවිඩ් වසංගත තත්ත්වය, ඉන්ධන අර්බුදය හා 2021 හා 2022 වර්ෂයට අදාළව රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත රාජ්‍ය හා පෞද්ගලික අංශවල පුහුණු වැඩසටහන්, පුහුණු සැසි සීමා විය. | වත්කම් ඵලදායිව හා ආර්ථිකමය වශයෙන් කළමනාකරණය කිරිමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමෘද්ධි සහනාධාර වශයෙන් ප්‍රතිලාභින් වෙත ලබා දෙන මුදලින් මාසිකව අරමුදලට අයකරනු ලබන දායක මුදලින් රු.7,560,000ක් යොදවා 2003 වර්ෂයේ පොතුවිල් සංචාරක බංගලාව ඉදිකර ඇති නමුත් භූමියේ නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවීය. 2004 වර්ෂයේදී මිලදී ගත් පිරිවැය රු.1,082,284ක් වූ වත්කම් සංචාරක බංගලාව සතු වුවත් ආදායම් උත්පාදනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කළමනාකාරිත්වය විසින් නොගැනීම හේතුවෙන් මෙම දේපළ නිශ්කාර්ය වී තිබුණි | වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමියක මෙම ඉදිකිරිම සිදු කර ඇති හෙයින් සමාජ ආරක්ෂණ අරමුදල් භාරකාර මණ්ඩලය විසින් දෙන ලෙද උපදෙස් පරිදි එම ගොඩනැඟිල්ල තුළ ඇති භාණ්ඩ හා උපකරණ ඉන්වෙන්ට්‍රි ලේඛන අනුව පරික්ෂාකර, ඒ අනුව ලැයිස්තුගත කර නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය වෙත භාර දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර ගොඩනැඟිල්ල වන ජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදීම සඳහා නැවත වරක් වන ජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වා යවන ලදි. | වැය කරන ලද මුදලට සාපේක්ෂව ආර්ථිකමය ඵලදායිත්වයක් ලබා ගත හැකි පරිදි තීරණ ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිගණක 340 ක් ප්‍රසම්පාදන කිරීම සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 14 දිනැති ප්‍රසම්පාදන කමිටුව විසින් ඒකක පිරිවැය රු.116,450ක් බැගින් රු.39,593,000ක් වූ අවම ලංසුව ඉදිරිපත් කරන ලද ආයතනය තෝරා ගෙන තිබුණි. දේශීය නිෂ්පාදකයින් සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුය යන පදනම මත රාජ්‍ය ආයතන විසින් ප්‍රසම්පාදන කාර්යයන් සිදුකිරීමේදී කටයුතු කළ යුතු බව ලංසුකරුවෙකු විසින් පෙන්වා දීමෙන් පසු නැවතත් ලංසු කැඳවා 2021 ජුනි 08 දිනැති ප්‍රසම්පාදන තීරණය පරිදි තෝරාගත් සැපයුම්කරු දෙවන ලංසු කැඳවීම් අනුව වැඩිම ලංසුමිල ඉදිරිපත් කළ ආයතනය වූ අතර එම ලංසුකරු දේශීය වරණය සහිත එකම ආයතනය බව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තිරණය කර තිබුණි. ඒ අනුව රු.149,632 බැගින් පරිගණක 340 ක් රු.50,874,880ක (වැට් සහිත) මිලකට මිලදී ගෙන තිබුණි. පලමු ප්‍රසම්පාදනයේදී | නැවත මිළ ගණන කැඳවීමේ දී දේශීය නිෂ්පාදනයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 03/2022 සලකා බලා තිබූ අතර ඒ අනුව දේශීය නිෂ්පාදනය කරනු ලබන කාණ්ඩය යටතේ මිලගණන් ලබා දී තිබූ එකම ආයතනය අවම මිල ලබා දී තිබූ අතර එම ආයතනයෙන් පරිගණක මිල දී ගන්නා ලදි. ඒ සඳහා ඒකකයක වටිනාකම රු.149,632ක් බැගින් පරිගණක 340 ක සඳහා රු.50,847,880ක් වැය දරා ඇත. | ප්‍රසම්පාදන ක්‍රමවේදය තුලින් බලාපොරොත්තු වන ආර්ථිකභාවය අරපිරිමැසුම්බව හා විනිවිදභාවය ඉටුවන පරිදි මිලදී ගැනිම් කල යුතුය. |

රු.39,593,000ක වටිනාකමට මිලදීගැනිමට හැකියාව තිබියදී ලංසු කැඳවීම් ආරම්භ කරන ලද කාලයට අදාළ නොවන චක්‍රලේඛ උපදෙස් අනුගමනය කර නැවත ප්‍රසම්පාදනය කිරිම හේතුවෙන් අරමුදලට සිදුවි ඇති පාඩුව රු.11,281,800 ක් විය.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(1)(ඇ) ප්‍රකාරව ඉදිරි වර්ෂයේ අයවැය ලේඛණය සකස් කොට පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 ට පෙර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම අරමුදලේ වියදම් සඳහා පමණක් වියදම් ඇස්තමේන්තු සකස් කර තිබූ අතර ආදායම් ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරි වර්ෂයේදී කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ අයවැය ලේඛනය සකස් කර ඉදිරිපත් කළ යුතුය. |